# ශ්‍රීමත් අනගාරික ධර්මපාල දැක්ම අදට ගලපමු

**පූජ්‍ය මහාචාර්ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි**
සංස්කෘත අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

2014 සැප්තැම්බර් 17 වන දිනට ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ 150 වන ජන්ම දිනය සමරන ලදි. ඒ විශිෂ්ට දේශජ පුත්‍රයාගේ ගුණ සැමරිය යුත්තේ ජීවදත්ත අනුස්මරණය කිරීමෙන් පමණක් නොවේ. දූරදර්ශී චින්තකයකු වශයෙන් අනාගත ශ්‍රී ලංකාවේ අභාග්‍ය සම්පන්න අත්දැකීම් අනාගත වක්තෘවරයෙකුව නිවැරදිව ප්‍රකාශ කළ දේශකයාණන් එතුමන් වන හෙයින්, එතුමන් සැමරිය යුත්තේ එකී ප්‍රකාශන අදට ගළපමිණි. එම සැමරීම අර්ථවත් වන්නේ එවිට පමණි.

යුග පුරුෂයකුගේ ජීව දත්ත අනුස්මරණය කරමින් සරල උත්සව පවත්වා සැමරීම මඟින් ඒ විශිෂ්ටතා අමතක නොකළාය යන අපවාදයෙන් ගැළවිය හැකි මුත් ජාතියට ප්‍රයෝජන අල්පය. මේ වන විටත් එකී වරද නිවැරදි කර ගත නොහැකි තරමට ම ජාතික වීරයන් සැමරීමේ යුතුකම පැහැර හරිමින් සිටී.

අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් කළ සම්පත් කැප කිරීම හා සත්චේෂ්ටාවන් කෘතඥතා පෙරදැරි ව අනුස්මරණය කරන ගමන් ම එතුමන්ගේ දැක්ම අදට ගළපමු.

"අවවාද කරන විට බොහෝ තැන්වල දී හිත් වේදනා දෙන අන්දමට මවිසින් වචන ව්‍යවහර කරනු ලබන්නේ යැයි මට කරන චෝදනාවකි. ගුරු දෙමාපියාදීහු රළු වචනයෙන් කතා කරති. අන්තරාය කරන චේතනාවක් නැති නිසා ඒ වචන එරුෂ වචන මෙන් නොගත යුතුය". යන ධර්මපාල ප්‍රකාශනය ගනිමු. සිංහල වාග් ව්‍යවහරයෙහි ප්‍රාස්තාවික භාෂා නමින් භාෂා ප්‍රභේදයක් වෙයි. කිසියම් වචනයක තේරුම ගත යුත්තේ අදාළ සන්දර්භයට අනුව වීම සිංහලයේ ප්‍රාස්තාවික භාෂා ප්‍රභේදයේ ලක්ෂණයකි. "දෙන්න" යන වචනය හා "දියව්" යන වචනය ගනිමු. ""දියව්" යන්න ආචාරශීලි වචනයක් නොවන බව සාමාන්‍ය හැඟීමයි. ධර්ම දේශනාවේ දී සම්භාව්‍ය දේශනයක දී "දියව්" යන්න භාවිත නොකෙරේ. එය ආචාරශීලී නොවේ යැයි සිතෙන හෙයිනි. එහෙත් උද්ඝෝෂණයක දී "දියව් අපට දියව්" යනුවෙන් කරන හඬ ගෑම ඒ සන්දර්භයට නොගැළපෙන්නක් නොවේ. එබඳු උද්වේගකාරී අවස්ථාවක දෙන්න දෙන්න අපට දෙන්න යැයි හඬ ගෑම හාස්‍යෝත්පාදක ය. ඒ සන්දර්භයට එහෙයින් දියව් යන්න ගැළපෙන්නේ ය. "කුරුල්ලනේ නුඹලගේ සන්තෝෂය මඳකට අපට දියව්" යන ගී පදයෙහි "දියව්" යන්න සලකා බැලෙන්නේ වෙනත් සන්දර්භයකය. යන්න, පලයන්, පලයන් යකෝ යන්න, පල ආදී ව්‍යවහාර සභ්‍ය හෝ අසභ්‍ය වන්නේ ඒ අනුව ව්‍යවහරික සන්දර්භය අනුවය. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් පල් මෝඩයෝ, ඔලමොට්ටල සිංහලයෝ නැගිටිව්,

නියෝ නියෝ හිටපල්ලා වැනි ප්‍රකාශ අනාදරයෙන් කළ අසභ්‍ය ප්‍රකාශ නොවන්නේ ඉහත කී සන්දර්භ න්‍යායයට අනුවය. වචනයක තේරුම් රසක් වෙයි. වාච්‍යාර්ථ, ව්‍යංග්‍යාර්ථ, ව්‍යංජනාර්ථ, ධ්වනිථාර්ථ, සංස්කෘතිකාර්ථ ආදී වශයෙනි. හදවත යනු හෘදය වස්තුව නොවේ. ඔබේ හදවත මට දෙන්නැයි කරන ආදරණීය ප්‍රකාශයෙහි අර්ථය ඔබේ හෘදය මට දෙන්නැයි කියද්දී නො ඒ. ඒ අනුව හදවත යනු හෘද වස්තුව නොවේ. අපේ තාත්තා පල්ලියට ගිහිං ෆාදර් හම්බ වෙලා ආවා යැයි කියද්දී තාත්තා යනු ෆාදර් නොවේ. ඒ අනුව සිංහලයේ වචනයක අර්ථය ගත යුත්තේ සන්දර්භයට අනුවය. සන්දර්භය යනු කාලය, දේශය, ස්ථානය, අවස්ථාව, මාතෘකාව ආදියයි. බොදු බල සේනාවේ හාමුදුරුවන්ගේ වචන හරි නැතැයි කියන්නන්ට මේ කරුණ අදාළ කර ගත යුතු යි. බණේ දී බණ කියන හාමුදුරුවරු අණේ දී අණ කරයි. ඒ සන්දර්භයට අනුවය. ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ වාග් ව්‍යවහරයන් අදට ගළපාලිය යුත්තේ එසේ ය. අප ඉදිරියේ මාර්ග දෙකක් ඇත. එක්කෝ අප වහලුන් වී ජාතික පැවැත්මෙන් අතු ගා ගෙන යාමට ඉඩ දිය යුතුය. නැති නම් පිරිහී ගෙන යන සදාචාරයෙන් අපගේ ජාතිය ගලවා ගැනීමට අරගලයක් කළ යුතුය. ක්‍රිස්තියානීහු ද බෞද්ධයෝ ද එකමුතුව සිංහල ජනතාව නගා සිටුවීමට පියවර ගත යුත්තාහ. අපගේ දේශප්‍රේමී කටයුතුවලට ආගම බාධාවක් කර ගත යුතු නැත. අපට අවශ්‍ය දැන් වැඩ කළ හැකි මිනිසුන් කණ්ඩායමකි. ලෝක ඉතිහාසයේ අපට නැති වූ තැන අප ලබා ගත යුතුය. ඒ අනිත් ජාතීන් පිරිහෙලන මානසිකත්වයෙන් නොවේ. නැති වූ තැන අප ලබා ගත යුත්තේ හුදෙක් ස්වකීය ජාතිය අගය කිරීමෙන් නොව ජාතිකභාවය ඉදිරියට ගෙන ඒමෙන් පමණක් බව එතුමෝ දුටහ. "සිංහලයිනි, නැගිටිව්. බුද්ධගයාව බේරා ගනිව්" යැයි හඬ නැගුවා මිස " බෞද්ධයිනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිව්" යැයි එතුමන් හඬ නැගුවේ නැත. ජාතියේ පුරෝගාමී සාර්ථකත්වය නෙලා ගැනීමට නම් ආගමිකත්වය එරෙහි මනසින් භාවිත කිරීම නවතා ජාතියක් වශයෙන් එකට සිටිය යුතු යැයි සිතීම අදටත් නොවටී ද? සාමාන්‍යයෙන් සිංහල කිතුනුවෝ අප්‍රේල් මාසයේ එළඹෙන සිංහල අලුත් අවුරුද්ද නො සමරති. ඒ සිංහල අවුරුද්ද බෞද්ධ අවුරුද්ද යැයි ඔවුන් සිතන හෙයිනි. මනසින් සිංහල වූ ද කයින් ශ්‍රී ලංකාවේ ජීවත් වන්නා වූ ද කිසිදු කිතුනුවෙකුට සිංහල අවුරුද්ද නොසමරා සිටිය නොහැකි ය. එහෙත් කයින් සැමරිය නොහැකි යි. සාමාන්‍යයෙන් යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරු කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි හා කිඹුල්වත් නුවර සිතින් ජීවත් වන බෞද්ධයා ලාංකිකයෙක් නොවන්නේය. සිතින් මක්කම ජීවත් වන මුසල්මානුවා ලාංකිකයෙක් නොවන්නේය. සිතින් රෝමයේ හෝ එංගලන්තයේ ජීවත් වන කිතුනුවා ලාංකිකයෙක් නොවන්නේය. මුලින් ම සිදු විය යුත්තේ ලංකිකයෙක් වීම ය. එවිට ඔහු ලාංකේය ජාතිකයකු වන්නේ ය. එසේ වීමෙන් අනතුරුව කවර හෝ ආගමක ඇදහිලිවන්තයකු අනුගාමිකයකු වීමේ වරදක් නැත. දූරදර්ශී ධර්මපාල දර්ශනයේ නූතන යථාර්ථය එයයි.

"සිංහලයිනි, පරජාතීන් ගෙනවිත් පුරවන මත්පැන් බොන්න එපා. මරක්කලයන් දිහා බලනු. ඔවුන් මත්පැන් බොනවා ද? දේවතාවුන් සරණ යන දෙමළ වර්ගයා දිහා බලනු. ඔවුන් ඌරු මස්, හරක් මස් කනවා ද? ඉංග්‍රීසින් දිහා බලනු. ඔවුන් කෙතරම් වීර්යය කොට ධනය උපයනවා ද?" යන ප්‍රකාශය නූතන ශ්‍රී ලංකාවේ ගෝලීය ධනවාදයේ අනුකාරක පාරිභෝගිකයෙකු වූ ශ්‍රී ලාංකිකයාට මනා පාඩමකි. ඒ ප්‍රකාශය, දේශීය ප්‍රාග්ධනය විදේශීය ව්‍යාපාර ජාලය විසින් අත්පත් කරගනිමින් සිටින්නා වූ ද, රට වැසියා හා විදේශගත කොල්ලකරුවන් විසින් ජාතික දේපල කොල්ලකමින් සිටින්නා වූ ද තත්වයක් තුළ, හුදෙක් සරල අවශ්‍යතා සඳහා ගාමන්ට් ෆැක්ටරි න්‍යායයෙන් එදා වේල ආර්ථිකයට ගමන් කරමින් සිටින්නා වු ද ජාතියේ අනාගත නියාමන යාන්ත්‍රණය බන්දේසියක් මත තබා ස්වේච්ඡාවෙන් විජාතිකයන්ට පූජා කරන්නා වූ ද නූතන ලාංකිකයාට බියකරු ඇස් ඇර වීමකට පාදන්නේ ය.

"මතක තියා ගනිල්ලා කවදා හරි සුද්දෝ මේ රට දාලා යනවා. උන් යන්නේ උන්ගේ දරුවෝ වාගේ කළු සුද්දෝ විසිතිස් දාහක් බෝ කළාට පස්සේ. ඊට පස්සේ අපේ රට පාලනය කරන්නේ මේ කළු සුද්දෝ. උන් සිංහල භාෂාවට, සිරිත්විරිත්වලට වෛර කරනවා. උන් උඹලගේ දූ දරුවන්ටත් උගන්නාවි ජාති, ආගම්, භාෂා භේදයක් එපා කියල. දෙමළත්, මරක්කලයත්, හම්බයත් එකයි කියලා උන් කියාවි. එහෙම කියල උන් පන්සල වටේ කෝවිල් පල්ලි හදාවි. උඹලා, උඹලා වෙනුවෙන් දියසේන කුමාරයා ඉපදෙනකම් බලා ඉන්නවා. ඉපදෙන්න ඉන්න දියසේනලා උපන් තිඹිරි ගෙයි ම මරා දාන්න මේ කළු සුද්දන්ට පුළුවන් බව මතක තියා ගනිල්ලා." ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ අතිශය ප්‍රකට ඉහත ප්‍රකාශය එතුමන්ගේ 150 වන ජන්ම දිනයේ තේමා පාඨය තරම් ම වටින්නේ ය. පුදුම සහගත දුරදර්ශිභාවයක් සහිතව කළ ඉහත ප්‍රකාශය අද වන විට සම්පූර්ණ සත්‍යයක් ව පවතින්නේ ය. ධර්මපාලතුමාගේ ජාතික ප්‍රබෝධය ඉන් අනතුරුව ම අතට ගත්තේම කළු සුද්දන් විසිනි. ඒ පිළිබඳ කතාව දිග හෙයින් අද හා ගලපමු. ගෝලීය ධනවාදයේ සුචච කීකරු ගෝලයන් හෝ කුලීකරුවන් හෝ ස්වේච්ඡා ප්‍රවේණි දාසයන් හෝ විසින් හෝ අද රට කරවනු ලැබේ. දේශපාලනය හා පරිපාලනය යන ක්ෂේත්‍ර දෙක ම බොහෝ විට නියෝජනය වන්නේ එබන්දන්ගෙනි. සැබවින් ම  ජාතික දේශපාලනයක් රට තුළ ස්ථාපිත කරන්නට මතු නොව හඳුන්වා දෙන්නට වත් අපට නොහැකි වුවා සේ ය. ශතෙන් ශතේ රුපියලෙන් රුපියල එකතු කරනා ශ්‍රී ලාංකිකයාගේ කඳුළු  කාසි හා දාඩිය නෝට්ටු මූණට පවුඩර් දමා කොල්ලකරුවන් අතට පත් කරවන හිඟන දේශපාලනයක් අපි රට තුළ අත්දකිමින් සිටිමු. හෙට දවසේ තම දෝතට රට වැටේ යැයි සිතා සිටින සිඟාලක කුලයේ දේශපාලකයින්ට ඒ තරම්වත් දැක්මක් නැත. ධර්මපාලවාදය  ප්‍රායෝගික කරන්නට ලෙනින්වරයෙක් අප අතර ඇත්ද? එය සෙවිය යුත්තකි.

''ඉංග්‍රීසි දත් සිංහලයන්ගෙන් ගරු බුහුමන් ලබන්නට නම් ඔවුන්ට වඩා භික්ෂූන් ඉංග්‍රීසයෙහි සමත් විය යුතුය." යන්න ද අනගාරික ධර්මපාලතුමන්ගේ දුරදර්ශි දැක්මකි. ලාංකේය භික්ෂූන්

වහන්සේ වෙනත් රටක භික්ෂූන් වහන්සේට වඩා සුවිශේෂී බව එතුමා දුටුවේ ය. ලංකාවේ බුද්ධාගම ද වෙනත් රටෙක බුද්ධාගමට වඩා වෙනස් බව එතුමා දුටුවා සේ ය. ලංකාවේ භික්ෂූන් වහන්සේගේ කාර්ය භාරය හුදෙක් සසුන රැකීම පමණක් නොවන බව එතුමා සැලකීය. ලාංකේය සම්බුද්ධ ශාසනය ද සසුන සේ ම රට පදනම් කරගත්තක් බව එතුමා දත්තේය. මලෙන් සුවඳ වෙන් කරගත නොහැක්කා සේ වර්ග කිලෝමීටර් හැටපන්දහස් හයසිය තිස් දෙකක බිමින් ශ්‍රී ලාංකීය බෞද්ධ සංස්කෘතිය වෙන් කර ගත නොහැක්කේය. සිරි ලක්බිමේ වෙසෙනා සකල විධ වර්ගයන්ට අයත් වූවෝ එහි සංස්කෘතියෙහි ජීවත් වෙති. ගහ කොල සතා සීපාවා ද ඊට ම හුරුය. මිනිසෙක් මිනිසෙක්ට වන්දනා කිරීම අරාබි ලෝකය අරුම පුදුම කරවන්නකි. එහෙත් පෙරදිග ලෝකයට එය අරුමයක් පුදුමයක් නොවන්නේ ය. කාෂාය වස්ත්‍රධාරී භික්ෂූන් වහන්සේට වන්දනා කිරීම සිරි ලක්බිමේ වෙසෙනා කිසිදු ජන වර්ගයකට අරුමයක් නොවන්නේ ය. අම්මා තාත්තා වන්දනා කිරීම, වැඩිහිටියන්ට බුලත් හුරුලු දී වන්දනා කිරීම, වැඩිහිටි දරුවන් ද කුඩා දරුවන් සේ ම ආදරයෙන් සැලකීම, ඇතැම්විට ගස් ගල් වන්දනා කිරීම ශ්‍රී ලාංකිකයා කරන්නේ හුදෙක් ගුප්ත ඇදහිලි වශයෙන් නොවේ. සංස්කෘතිකාංග වශයෙනි. සාංඝික දානය, බෝධි පූජා, පරිත්‍රාණ සජ්ඣායනා යාතා, කඨින පිංකම් මතු නොව පන්සිල් රැකීම ද බෞද්ධයන් විසින් කරනු ලබන්නේ හුදෙක් පිංකම් වශයෙන් ම නොවේ. සංස්කෘතිකාංග රැකීමක් ද වශයෙනි. සිල් සමාදන් වීම ද එසේ ම ය. ඒ අනුව ශ්‍රී ලංකාව සංස්කෘතික රටකි. එකී සංස්කෘතික දේශයෙහි සංස්කෘතිය ආරක්ෂා කරන්නෝ භික්ෂූහු වෙති. එකී සංස්කෘතියට අනුගත වීමට නම් භික්ෂූන් වහන්සේ ද ඊට අනුකූල ව සමානුපාතික ව වර්ධනය විය යුතුය. නූතන තාක්ෂණය හා නූතන භාෂා පිළිබඳ බුහුටි භාවිතාව භික්ෂූන් වහන්සේ කතා කිරීම ද ඇතැම් සාමාන්‍ය ජනතාව දැක ඇත්තේ පාරාජිකා වන පාපකර්මයක් ලෙසිනි. අද ද භික්ෂූන් වහන්සේ පරිගණක භාවිතය, අන්තර්ජාල භාවිතය පිලිබඳ ඇතැම් බෞද්ධයන් තුළ ඇත්තේ එබඳු ආචීර්ණ කල්පික මනෝභාවයකි. එහෙත් අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් සිතුයේ වෙනත් විදියකටය. "දඹදිව දැනට පුරාණ විහාර දාගැබේ තිබේ. නමුත් භික්ෂු සංඝයා නැති හෙයින් ශාසනයක් නැත." යන ධර්මපාල නිරීක්ෂණය ඉතා ගැඹුරු ය. ගල්, වැලි, සිමෙන්ති, යකඩ, විදුරු, ලී සමග බුදුසසුන ගොඩ නගන්නට වෙර දරනා නූතන බෞද්ධයන්ට එදා සිටි ධර්මපාලතුමා අදට දෙන පණිවුඩය නම් සිය දරුවන් අතරින් අයෙකු පැවිදි කොට ඔවුන් රටට එළියක් වන සේ සේ භික්ෂූන් වහන්සේ නමක් ලෙස සංවර්ධනය කිරීම ජාතික අවශ්‍යතාවක් බවය. තව ද, සසුන්ගත කරවීමට තරම් දරු පිරිසක් රටට බිහි කළ යුතු බව ය. අනගාරික ධර්මපාල අධ්‍යාපන දැක්ම ගොඩනගා ගැනීමට මේ ප්‍රකාශය ද කියවන්න. " ශිල්ප, කර්මාන්ත, විද්‍යා ඉගෙන ජපන්නු යුරෝපීයයන් පරාජය කළහ. අපේ සිංහල තරුණ පෙළ නීතිය හා වෙදකම පමණක් ඉගෙනීමට වීර්ය කරති. ශිල්ප කර්මාන්ත ගැන කල්පනා නොකරන ජාතිය දුගී වන්නේ ය." මේ ප්‍රකාශය හා ඊට ආනුසාංගික සමාජ සත්තාවන් අද වන විට සැබෑ වී හමාර ය. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික ප්‍රතිපත්තිය සකස් කළ ඇතැමුන් සිංහලයා සේවා දායකයකු කිරීම ඉගෙනුමේ ඵලය සේ සලකා ප්‍රතිපත්ති සකස් කර ඇත.

නීතිය හා වෙදකම නමින් ධර්මපාල ශ්‍රීමතාණන් නම් කරනු ලැබ ඇත්තේ මේ යැපුම් මානසික අධ්‍යාපනයයි. රට සූරා කන විදේශික ආර්ථික ගිජු ලිහිණියන්ට පහසුකම් සපයන්නා වූ ද උන්ට වහල්කම් කරන්නා වූ ද පිරිසක් සිංහලයන් අතරින් ගොඩනගා ගැනීම රට විකිණීම සඳහා වන පළමු පහසුකම වන්නේ ය. සියවස් ගණනක් පුරාවට රටේ සාරය උරාගත් හා දැනට රට විකිණීම සඳහා වන පළමු පහසුකම වන්නේ ය. සියවස් ගණනක් පුරාවට රටේ සාරය උරාගත් හා දැනට උරා ගනිමින් රට හප කරමින් සිටින්නා වූ ද විදේශික හා විදේශ ගැති ආර්ථික ඝාතක වච්ලන් පහසුවෙන් එල්ලී සිටින්නේ ඉහත කී අධ්‍යාපන ප්‍රතිපත්තියේ ය. උන්ගේ කොම්පැනිවල ගණන් එකතු කරන්නට හා උන්ගේ බැංකුවලට ලාබ බැර කරන්නට හැකි ගණකාධිකාරිවරුන් ද, උන්ට ඕනෑ බීජ වවන්නටත් අපට ඕනෑ බීජ නසන්නටත් හැකි හා උන්ගේ නිර්දේශ මත වතුර බෙදන්නටත් පොර ගෙන්නන්නටත් හැකි කෘෂි විද්‍යාඥයන් ද, උන්ට ඕනෑ පරිදි බෙත් මාපියා හස්තයකින් රෝගීන් හප කරන්නටත් දැනට පරඬැල් ව ඇති සිංහල ඇඟවල් පඟරනට්ටන් කළ හැකි රසකාරක, උත්තේජකාරක, පිපුම්කාරක, වර්ණකාරක ආහාරවලට එකතු කිරීම ඉවසා දරා සිටින්නා වූ හෝ මුවින් නොබැණ තුෂ්ණිම්භාවයෙන් අනුමත කරන්නා වූ හෝ රජරට වකුගඩු රෝගය හැදෙන්නේ උන්ගේ පොරවලින් නොවන බවට පර්යේෂණ පත්‍රිකා ලියන්නා වූ හෝ පඬියන් නිර්මාණය වන්නේ ඉහත කී පරගැති අධ්‍යාපන ප්‍රතිපත්තියෙනි. රටත් රටේ වපසරියත් ප්‍රෞඪත්වයත් සාරයත් යටගියාවත් නොහඳුනන්නා වූ ද, ජීවිතය වනාහි හිරු උදාවේ සිට සඳ උදාව දක්වා වූ කාලයක බඩ පුරවාගෙන ඇඟ පිනවීම පමණකැයි  සිතන්නා වූ ද, බෝගන්විලා ඇඟක් ද, රබර් කසේරුකාවක් මුට්ටි හිසක් සහිත එක්කැයි සිතන්නවුන්ට රටක අධ්‍යාපන ප්‍රතිපත්තිය විය යුත්තේ මෙය යැයි ධර්මපාල ශ්‍රීමතාණෝ දිවංගත ව සිට අපට අණ කරති. ශිල්ප, කර්මාන්ත, විද්‍යා ඥානය රටක ස්වායක්ත ධනස්කන්ධයක් එක් රැස් කර ගත හැකි විනිමය ආකර්ෂණය කරන හා එමගින් බලය හා ධනය සහිත සාර්ථක රජ්‍යයක් නිර්මාණය කර ගත හැකි අයුරු පිලිබඳ අධ්‍යාපන ප්‍රතිපත්තිය වෙනස් කර ගැනීමට තවත් කල් ඉතිරි ව තිබේ. ස්ත්‍රීන්ගේ රිරිමාංශය සුල්තාන්ලාට හා මුහම්මදිකයන්ට විකිණීමේ ජඩ පිළිවෙතකට වඩා කොස් ඇට රට පැටවීම අගනා නොවේ දැයි කොස් ඇටයක් තරම් මොලයක් ඇතියෙකුට වැටහී යා යුතු ය. අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් සමරා උත්සව පමණක් කෙරෙන විටක එතුමා වෙනුවෙන් කළ යුතු තවත් බොහෝ දේ ඇති බවත් ඉන් එතුමා දුටු ප්‍රතිපත්තිය ධර්මපාල දැක්ම ලෙස ජාතියට එන්නත් කරවිය යුතු බවත් අප කාට කාටත් තේරුම් යා යුත්තේ ය. අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන් නමින් කොඩි එසවිය හැක්කේත් ප්‍රණාමය පුද කළ හැක්කේත් එවිට පමණි.